දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
DISTANCE AND CONTINUING EDUCATION UNIT – UNIVERSITY OF RUHUNA

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) පරීක්ෂණය - 2014 අප්‍රේල්
First Examination in Arts (External) - April 2014

ඉප්‍ර 1.2 - ඉන්දියා ඉතිහාසය (ආරම්භයේ සිට ක්‍රි.ව. 10 වන සියවස දක්වා
HY 1.2 – History of India (From the beginning to 10th Century AD)

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.
නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

---

(01) ඉන්දු නිම්න ශිෂ්ටාචාරය බිඳ වැටීමට ඉවහල් වූ කෙටි කාලීන හා දීර්ඝකාලීන හේතු සාධක පරීක්ෂා කරන්න.

(02) ඉන්දියාවේ භූගෝලීය පිහිටීම එරට ඉතිහාසය හැඩගැස්වීමෙහිලා බලපා ඇති ආකාරය පැහැදිලි කරන්න.

(03) ක්‍රි.පූ. 06 වන සියවසේ ඉන්දියාවේ පැවති දේශපාලන වාතාවරණය පැහැදිලි කොට හර්යංක පෙළපත යටතේ මගධ රාජ්‍යයේ නැගීම සිදු වූ අන්දම පෙන්වා දෙන්න.

(04) සුවිශාල් මෞර්ය අධිරාජ්‍යයේ පදනම සකස් කිරීමෙහිලා චන්ද්‍රගුප්ත මෞර්යගෙන් සිදු වූ මෙහෙය අගයන්න.

(05) "මෞර්ය අධිරාජ්‍ය බිඳ වැටීම සඳහා මෞර්ය යුගයේ කීර්තිමත් පාලක අශෝක අධිරාජ්‍යයා වගකිව යුතු නොවේ" විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

(06) ගුප්ත අධිරාජ්‍යයේ බල ව්‍යාප්තිය සඳහා සමුද්‍රගුප්ත අධිරාජ්‍යයේ කාර්ය සාඵල්‍යය විමසන්න.

(07) "සකල උත්තරාපථ නාථ" යන විරුදනාමය හර්ෂ අධිරාජ්‍යයා හැඳින්වීමට කෙතරම් උචිතදැයි විමසන්න.

(08) "සයුරෙන් එතෙරට විහිදුණු අධිරාජ්‍යයක් ලෙස" චෝළ අධිරාජ්‍යයේ බලය ව්‍යාප්ත කිරීමට I පරන්තක හා I රාජේන්ද්‍ර යන චෝළ රජවරුන්ගෙන් ඉටු වූ මෙහෙය අගයන්න.

..................................